**1.** **තනතුර - රියදුරු**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

i. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙන් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) කින් සමත් වීම.

**(ආ) ප්‍රවීණතා (පහත i සහ ii අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුයි)**

i. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

ii. රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත i සහ ii අවශ්‍යතාවයන් සපුරා තිබිය යුතුයි)**

i. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

ii. ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2) හෝ ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 3 - 2025

මූලික වැටුප - රු. 40,834.00 (2026), රු. 43,280.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,834.00+17800.00x12 = රු. 703,608.00 (2026)

43,280.00+17800.00x12 = රු. 732,960.00 (2027)

5. **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි රාජකාරි අවශ්‍යතාවයන් සඳහා ප්‍රවාහන සේවා ලබාදීම.

ii. පුනරුත්ථාපනලාභීන්ගේ පාලන කටයුතු සඳහා, අසනීප තත්ත්වයන් වලදී රෝහල් කරා රැගෙන යාම සඳහා, නඩු වාරයන් වලදී බන්ධනාගාර වෙත/ උසාවි වෙත රැගෙන යාම සඳහා, ළගම ඥාතීන්ගේ අවමංගල්‍ය උත්සව සඳහා සහභාගි කරවීම සඳහා, උසාවි නියෝග මගින් ලබාදෙන වෙනත් අවශ්‍යතාවයන් සඳහා හා අවශ්‍යතාවය පරිදි පාලන අධිකාරිය විසින් පවරන ලද කාර්යයන් සඳහා අවැසි ප්‍රවාහන සේවය ලබාදීම.

iii. කාර්යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි අවශ්‍යතාවය මත බාහිර සම්පත්දායකයින් සඳහා අවැසි ප්‍රවාහන පහසුකම් සැලසීම.

iv. කාර්ය මණ්ඩල සමාජිකයන්ගේ පාලන කටයුතු සඳහා, අසනීප තත්ත්වයන් වලදී රෝහල් කරා රැගෙන යාම සඳහා හා අවශ්‍යතාවය පරිදි පාලන අධිකාරිය විසින් පවරන ලද කාර්යයන් සඳහා අවැසි ප්‍රවාහන සේවය ලබාදීම.

v. කාර්යාංශය හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ආහාරපාන, දේපළ හා උපකරණ ප්‍රවාහනය කිරීම.

vi. රථ වාහන නිසි පරිදි නඩත්තු කිරීම, ධාවන වාර්තා (පොදු 268) සටහන් කිරීම. ආරක්ෂිත රිය ධාවනය, මාර්ග ධාවන නීති පිළිපැදීම.

vii. කල් ඉකුත් නොවූ රියදුරු බලපත්‍රයක් තිබීම හා අවැසි අවස්ථාවන්හිදි රියදුරු බලපත්‍රය යාවත්කාලීන කර ගැනීම.

viii. ධාවන වාර්තා (පොදු 268) සටහන් පොතෙහි සඳහන්ව ඇති උපදෙස් පිළිපැදිම.